(71)

# බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීමේ හා යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීමේ පරිපාටිය

**01.** **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)
යොමු අංකය : LGD/2/21/03/06-1 වෙළුම
දිනය : 2016.08.10

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය : CM/WP/E15/5/1-27
දිනය : 2016.08.22

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමතකිරීම :
යොමු අංකය හා දිනය : DMS/WP/0601 හා 2016.04.22
DMS/D/0217 හා 2016.05.12

මුල් පිටපත විටිම්. සත්‍ය පිටපතක් බව සහතික කරමි.

1.4 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : -
යොමු අංකය :
දිනය :

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පු...)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

1.5 ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය :
යොමු අංකය : CSO/PTR/15/3/28
දිනය : 2016-09-09

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : 1/4/2/5/
දිනය :

1.7 බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :
යොමු අංකය :
දිනය :

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : WP/GOV/4/5/1343
දිනය : 2016/9/22

**02.** **පත්කිරීම් බලධරයා** : මහා නගර සභාවක් වන විට නාගරික කොමසාරිස් / නගර සභාවක් වන විට ලේකම්

**ක්‍රියාත්මක වන දිනය** : බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**03.** **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : නියාමන සේවා

3.2 ශ්‍රේණි : අදාළ නොවේ

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : පළාත් පාලන ආයතනයන්හි නීතිවලට අනුකූලව තනතුරට අදාළව ගිනි සහ වෙනත් ආපදා අවස්ථාවල දී ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා පවරනු ලබන කාර්යයන්

3.4 කාර්යයන් පැවරීම : තනතුරට නියම කරන ලද කාර්යයන් දෙපාර්තමේන්තු ප්‍රධාන/ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිතය**

**05.** **වැටුප්**

5.1 වැටුප් කේත අංකය : RS1-2016 (රා.ප.ච.ලේඛ 03 / 2016 අනුව)

5.2 වැටුප් පරිමාණය : රු. 29,540/- 07 x 300 - 27 x 370 - 41,630/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

RS–1 වැටුප් ක්‍රමය ලබාදී ඇති තනතුරු සඳහා ශ්‍රේණිගත උසස්වීම් ක්‍රමයක් අදාළ නොවන බැවින් තනතුරට නියමිත ආරම්භක වැටුප් පියවර පහත පරිදි වේ.

| තනතුර | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| ගිනිභට | 01 පියවර | රු. 29,540/= |
| යාන්ත්‍රික ගිනිභට | 05 පියවර | රු. 30,740/= |

සටහන :
බඳවා ගැනීම්, උසස්කිරීම්වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය.එහෙත් ගෙවීම් කළ යුත්තේ , උපලේඛන II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියේ සඳහන් කළ යුතුය.

**06.** **සේවා ගණයට අයත් තනතුර /තනතුරු**

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ගිනිභට | අදාළ නොවේ | 440 *15 | i. ගිනි නිවීම් සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම් හා පුහුණු කිරීම.<br>ii. ගිලන් රථ සේවා, තාක්ෂණික සේවා, සන්නිවේදන රාජකාරි, ප්‍රභූ ආරක්ෂක සේවා සහ ගිනි නිවාරණ පොරොත්තු රාජකාරි.<br>iii. හදිසි ආපදා, හදිසි මුදා ගැනීම් සහ විවිධ මානුෂීය අවශ්‍යතාවන් සඳහා වන මෙහෙයුම්.<br>iv. ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සියලුම කාර්යයන්.<br>v. සේවාවේ ඉහළ නිලධාරීන් විසින් පවරනු ලබන රාජකාරි කටයුතු යටතට ගැනෙන සියලුම රාජකාරි<br>vi. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝගවලට අනුව තම කාර්යයන් ඉටු කිරීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 600/4/2/1/2/345
දිනය : 2018/...

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරි (වැටුප් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

| | | | |
|---|---|---|---|
| | | | vii. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම |
| යාන්ත්‍රික ගිනිහට | අදාළ නොවේ | 124<br>*16 | i. ගිනි නිවීම් සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම්, පුහුණු කිරීම හා අවශ්‍ය වෙනත් සියලුම රාජකාරි කටයුතු සඳහා යොදා ගනු ලබන ගිනි රථ, බවුසර රථ, ආපදා රථ, ගිලන් රථ හා මෝටර් රථ පැදවීම, පොම්ප සහ අදාළ සියලුම තාක්ෂණික උපකරණ ක්‍රියා කරවීම , නඩත්තු කිරීම හා ආරක්ෂාව<br>ii. ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වාගෙන යාම සහ මෙහෙයුම් ස්ථානවලදී මෙහෙයුම් කටයුතු සඳහා ගිනිහට නිලධාරීන් නිසි පරිදි මෙහෙයවීම<br>iii. සේවාවේ ඉහළ නිලධාරීන් විසින් පවරනු ලබන තනතුරට අදාළ රාජකාරි කටයුතු යටතට ගැනෙන සියලුම රාජකාරි<br>iv. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝගවලට අනුව තම කාර්යයන් ඉටු කිරීම<br>v. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම |

මුල් පිටපත සමඟ සසඳා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 595

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ............
දිනය : ............

| ආයතනය | ගිනිහට | යාන්ත්‍රික ගිනිහට | *ගිනිහට | *යාන්ත්‍රික ගිනිහට |
|---|---|---|---|---|
| කොළඹ මහ නගර සභාව | 273 | 81 | - | - |
| දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 32 | 09 | - | - |
| මොරටුව මහ නගර සභාව | 24 | 06 | - | - |
| මීගමුව මහ නගර සභාව | 24 | 06 | - | - |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 24 | 06 | - | - |
| ගම්පහ මහ නගර සභාව | 24 | 06 | - | 06 |
| හොරණ නගර සභාව | 12 | 03 | 15 | 10 |
| කළුතර නගර සභාව | 27 | 07 | - | - |
| එකතුව | 440 | 124 | 15 | 16 |

* තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත තනතුරු

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

## 7.2 විවෘත බඳවා ගැනීම

### 7.2.1 බඳවා ගන්නා තනතුර : ගිනිභට

### 7.2.2 සුදුසුකම්

#### 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

එකවරක දී සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත් ව තිබිය යුතු අතර එම අවස්ථාවේදී ම හෝ තවත් එක් අතිරේක අවස්ථාවක දී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් ද සමත්ව තිබිය යුතුය.

#### 7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

#### 7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

#### 7.2.2.4 කායික සුදුසුකම් :

i. උස සෙ.මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය.(ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය)

ii. සෑම අපේක්ෂකයෙකු ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වියයුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

iii. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය

iv. කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.
(උදා - පච්ච කොටා තිබීම වැනි)

#### 7.2.2.5 වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

iii. අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

iv. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය.

v. තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

මුල් පිටපත ... සත්‍ය පිටපතක් බව ... කරමි.
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (ලිපි හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 24 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

i. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිභටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

ii. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිභටයින් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

iii. පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාල සීමාව තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

iv. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

v. පුහුණු කාලසීමාව තුළ මාසික ව රු.10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

vi. පුහුණු කාල සීමාව තුළ දී කිසිම ආධුනික ගිනිභටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

vii. පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු.500,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේ දී අත්සන් කළ යුතුය.

viii. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

මුල් පිටපත දිටිමි.
එස්. එම්. එච්.
පරිපාලන නිළධාරි
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

ix. ගිනිහට තනතුර සඳහා පත්වීම ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

( විෂය නිර්දේශය උපලේඛන අංක 01හි දැක්වේ )

7.2.4.1.1 පවත්වන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් නම් කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :
(ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික) )
සටහන :
මෙම පරීක්ෂණයට සහභාගී වීමේ දී ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුවේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දරා ගැනීමේ හැකියාව | 60 | 36 |
| සමබරතාවය | 40 | 24 |

( විෂය නිර්දේශය උපලේඛන අංක 02හි දැක්වේ )

7.2.4.2.1 පවත්වන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු :
මූලික සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා:
පත්කිරීම් බලධරයා

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ............
දිනය : ............
මුල් පිටපත් ඉටිම්.
සත්‍ය පිටපතක් බව සහතික කරමි
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ පුවත්පත්වල ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙයට අමතරව වෙබ් අඩවියේ දැන්වීම් පළ කළ හැකිය.

[මුල් පිටපත සහතික කරමි / සත්‍ය පිටපතක් බව සහතික කරමි]

**7.3 සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ

**7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම** : අදාළ නොවේ

[එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව]

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය /වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම | ගිනිහට තනතුරට බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර | ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක් උපලේඛන අංක 03 හා 04 |
| යාන්ත්‍රික ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම | යාන්ත්‍රික ගිනිහට තනතුරට උසස් වී වසර තුනක් ගතවීමට පෙර | ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක් උපලේඛන අංක 07 හා 08 |

[ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........
දිනය : ..........]

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?
වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

- ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම
- යාන්ත්‍රික ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම

} පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ |

## 10. උසස් කිරීම

### 10.1 යාන්ත්‍රික ගිනිහට තනතුරට උසස් කිරීම

#### 10.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. ගිනිහට තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම.

ii. ගිනිහට තනතුරේ අවම වශයෙන් වසර හතර (04) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර හතර (04) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර හතර (04) තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. ගිනිහට තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

vii. [illegible] බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති රියදුරු බලපත්‍රයක් ලබාගෙන තිබීම
(නව රියදුරු බලපත්‍රය අනුව D පන්තියේ බලපත්‍රයක් හෝ A පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම)

viii. යාන්ත්‍රික ගිනිහට තනතුරට අදාළ සති දෙකකට නොඅඩු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

#### 10.1.2 උසස් කිරීමේ ක්‍රමය

යාන්ත්‍රික ගිනහට තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්වලදී ඉහත අංක 10.1.1 හි සඳහන් සුදුසුකම් සපුරන ගිනිහට තනතුරේ නිලධාරීන්ගෙන් නියමිත ආකෘතිපත්‍රය මගින් (ඇමුණුම අංක 01) අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයකට භාජනය කර ඉන් සමත්වන්නන් වෘත්තීය පරීක්ෂණයකට (ප්‍රායෝගික) භාජනය කෙරේ. එම පරීක්ෂණ දෙකෙන්ම සමත් නිලධාරීන් පරීක්ෂණ දෙකෙහිම ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව යාන්ත්‍රික ගිනහට තනතුරු පුරප්පාඩු සඳහා උසස් කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය උපලේඛන අංක 05 හි ද වෘත්තීය පරීක්ෂණයේ (ප්‍රායෝගික) විෂය නිර්දේශය උපලේඛන අංක 06 හි ද දැක්වේ.

මුල් පිටපත සමඟ සසඳා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
එස්. එම්. එච්. කුසුමිසිරි
පරිපාලන නිලධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

12. **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටි රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට හා නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13. **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ..........
දිනය : ..........

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

- මෙම පරිපාටිය ක්‍රියාත්මක දිනට ගිනිහට තනතුරු දරන නිලධාරීන් මෙම පරිපාටිය යටතේ ගිනිහට තනතුරට ද
- යාන්ත්‍රික ගිනිහට තනතුර දරන නිලධාරීන් මෙම පරිපාටිය යටතේ යාන්ත්‍රික ගිනිහට තනතුරට ද අන්තර්ග්‍රහණය කෙරේ.
- අන්තර්ග්‍රහණය කිරීමට පෙර සිටි තනතුරට අදාළව එම තනතුරේ කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම අන්තර්ග්‍රහණය කරනු ලබන තනතුරේ කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සැලකේ.
- එසේම ඒ ඒ තනතුරුවලට අදාළව උසස් කිරීමේ පාඨමාලා සම්පූර්ණ කර තිබීම ද අන්තර්ග්‍රහණය කරන ලද තනතුරට ඉහළ තනතුරේ උසස්වීම සඳහා සලකා බලනු ලැබේ.
- මෙම පරිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කරන ලද සියලුම නිලධාරීන්හට හිමිව තිබූ ජ්‍යෝෂ්ඨත්වය එම නිලධාරීන් හට පෞද්ගලිකවම බලපැවැත්වෙන සේ තවදුරටත් නොවෙනස්ව පවතී.
- අන්තර්ග්‍රහණය කිරීමට පෙර සිටි තනතුරට අදාළව එම තනතුරේ කාර්යක්ෂමතා කඩඉම සමත් නොවූ නිලධාරීන් අන්තර්ග්‍රහණය කරනු ලබන තනතුරේ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. ඒ සඳහා මෙම පරිපාටිය අනුමත කළ දින සිට අවස්ථා තුනක සහන කාලයක් ලබා දෙනු ලැබේ.
- අන්තර්ග්‍රහණය කරන ලද සියලුම නිලධාරීන් RS 1 – 2016 වැටුප් පරිමාණයේ තනතුරට අදාළ වැටුප් තලයේ පිහිටුවිය යුතුය.

මුල් පිටපත සමග සැසඳූ
සත්‍ය පිටපතක් බව සහතික කරමි.
එස්. එම්. එච්. කුලසිරි
පරිපාලන නිලධාරි (විභාග හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

- අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව තීරණය කරනු ලැබේ.

- මෙහිදි ලබමින් සිටින වැටුප , නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරට සමාන වන අවස්ථාවල දී වැටුප් පියවරේ වෙනසක් ඇති නොවේ.

- වැටුප් වර්ධක දිනයේ ද වෙනසක් සිදු නොවේ.

**15.** **මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළුපැනනගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

**16.** **අර්ථ නිරූපණ**

**<u>සතුටුදායක සේවා කාලය:</u>**

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මගින් ද සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ [illegible] දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් [illegible].

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........
දිනය : ..........

නිලධරයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතු මත අත්හිටුවා , අඩු කොට, නතර කොට හෝ විලම්බනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ ,වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළ යුතු වන්නේය .

**<u>සක්‍රිය සේවා කාලය :</u>**

"සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

මුල් පිටපත
සත්‍ය පිටපතක් බව

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

## නියමිත දිනට :

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය, " නියමිත දිනය " ලෙස අදහස් කෙරේ. උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

උදා- වසර තුනකදී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස් වීම ලැබෙනුයේ වසර එකොළහකිනි.

සකස් කළේ: අත්සන ..........................

ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
පරිපාලන නිලධාරි
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
කොළඹ 07.
2016.08.05

පරීක්ෂා කළේ :..........................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

සසිකා ලියනගේ
නියෝජ්‍ය කොමසාරිස් (වැ. බ)
පළාත් පාලන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
2016.08.10

නිර්දේශ කර ඉදිරිපත් කරමි

දිනය : 2016.08.10

අත්සන ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම චන්ද්‍රානි සමරකෝන්
තනතුර පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.
නිලමුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........................
දිනය : ..........................

යොමු අංකය : **CM/WP/E15/5/1-27**

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුරට බඳවා ගැනීමේ හා යාන්ත්‍රික ගිනිහට තනතුරට උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2016.08.24

අත්සන : ..........................
නම : ..........................
ලේකම්
පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
නිලමුද්‍රාව එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල ...
... (බ.ප.)
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු ... - 07.

මුල් අනුපිටපත පිටපතකි.
සත්‍ය පිටපතක් ... සහතික කරමි.

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

යොමු අංකය : **CSO/PTR/15/3/28**

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීමේ හා යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2016-09-09

අත්සන : ......................................
නම : ......................................
ප්‍රධාන ලේකම් (බ.ප)
නිලමුද්‍රාව ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : ~~1/4/2/5~~ WPC/PSC/ADM/1/7/26

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීමේ හා යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 2018 . 09 . 07

අත්සන : ......................................
නම : ......................................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
නිලමුද්‍රාව එම්. ජී. ජේ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ආලේ/ආප/4/7/3-43
දිනය : 2018/9/22

යොමු අංකය : ආලේ/ආප/4/7/3-43

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීමේ හා යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීමේ පරිපාටිය [illegible] දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය 2018/9/27

අත්සන : ......................................
නම : ......................................
ආණ්ඩුකාර ලේකම්
නිලමුද්‍රාව **ඩී. සෝමසිරි**
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය,
10 වන මහල, ජනජය ගොඩනැගිල්ල,
අංක.628, නාවල පාර, රාජගිරිය.

මුල් පිටපත සමඟ ...
සත්‍ය පිටපතක් බව ...

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 01

**බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය**

1. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් ඒකකයන්හි ගිනිහට තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

2. විභාගයේ / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
   පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථාවල දී

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 6-7/47-1/7/13
දිනය : 2016/9/22

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය | ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධන සම්බන්ධයෙන් ඇති දැනුම,තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම , පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ..............................
තනතුර .............................. චන්ද්‍රානි සමරකෝන් පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.
දිනය ..............................
නිල මුද්‍රාව ..............................
2016 . 08 . 10

මුල් පිටපත සමඟ සසඳා බැලූ සත්‍ය පිටපතකි

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 02

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුරට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| දරා ගැනීමේ හැකියාව | අදාළ වන පරිදි | 60 | 36 |
| සමබරතාව | අදාළ වන පරිදි | 40 | 24 |

3. පවත්වනු ලබන බලධරයා :
   පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති වූ අවස්ථාවල දී

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපි ගොනු අංකය : ..................
දිනය : ..................

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| දරා ගැනීමේ හැකියාව | i. දිවීම (කිලෝ මීටර් 01 ක දුර දිවීමට ගත වන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>ii. ඩිප්ස් ගැසීම (නිවැරදි ව ඩිප්ස් 25ක් ගැසීමට ගතවන අවම කාලය)<br>iii. බර ඔසවාගෙන යෑම |
| සමබරතාව | i. ඉනිමගේ යාම<br>ii. කඹයෙන් බැසීම |

සටහන :
වෘත්තීය පරීක්ෂණයට සහභාගි වීමට පෙර අයදුම්කරුවන් තම ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුවේ.

අත්සන ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම .................. චන්ද්‍රානි සමරකෝන්
තනතුර .................. පළාත් පාලන කොමසාරිස්
දිනය .................. බස්නාහිර පළාත
නිල මුද්‍රාව ..................
2016 . 08 . 10

මුල් පිටපත දිටිමි.

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 03

**<u>බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)</u>**

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |
| ආයතන කාර්යය පරිපාටිය | පැය 01 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :
වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 1. ගිනිහට කාර්යයන්ට අදාළ සෛද්ධාන්තික කරුණු<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම්වල දී ගිනිහට රාජකාරි සඳහා යොදා ගැනීමේ අවස්ථා<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල දී ගිනිහට රාජකාරි පිළිබඳ දැනීම<br>4. ගිනි නිවීම් සේවා උපකරණ |
| ආයතන කාර්යය පරිපාටිය | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද ආශ්‍රයෙන් සකස් කළ ප්‍රශ්න පත්‍රයකි.<br>VII, XII, XXIII, XXVII,XXVIII,XLVII සහ XLVIII |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...................
දිනය : ...................

අත්සන ...................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ................... චන්ද්‍රානි සමරකෝන්
තනතුර ................... පළාත් පාලන කොමසාරිස්
දිනය ................... බස්නාහිර පළාත
නිල මුද්‍රාව ...................
2016.08.10

මුල් පිටපත අනුව සහතික කරමි
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 04

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් වෘත්තීය පරීක්ෂණය ( ප්‍රායෝගික)

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ප්‍රායෝගික)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | අදාළ වන පරිදි | 100 | 60 |

3. පවත්වනු ලබන බලධරයා :
   පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :
   වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........
දිනය : ..........

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 1. උපකරණ හඳුනා ගැනීම<br>2. උපකරණ ප්‍රායෝගිකව භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල දී ශ්වසන උපකරණ භාවිතය පිළිබඳ දැනීම<br>4. ඉනිමං ප්‍රායෝගිකව භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව<br>5. කඹ භාවිතයේ ප්‍රායෝගික අවස්ථා<br>(එක් විෂයක් සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 20 වන අතර සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 12 ක් බැගින් උපරිම ලකුණු 60 ක් ලබාගත යුතුය) |

මුල් පිටපත දිටිමි
සත්‍ය පිටපතක් බව සහතික කරමි

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

අත්සන ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ..........
තනතුර .......... චන්ද්‍රානි සමරකෝන්
දිනය .......... පළාත් පාලන කොමසාරිස්
නිල මුද්‍රාව .......... බස්නාහිර පළාත

2016.08.10

උපලේඛන අංක : 05

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
   පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
   පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයුම් | 1. ගිනි නිවීම් සේවා පොම්ප හා උපකරණ භාවිතය, නඩත්තුව පිළිබඳ දැනුම<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම්වලදී යාන්ත්‍රික ගිනිහුම් ආකාර සඳහා යොදා ගැනීමේ අවශ්‍යතා පිළිබඳ දැනුම |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 17/3/43
දිනය : ..................

අත්සන ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ..................
තනතුර ..................
දිනය .................. 2016.08.10
නිල මුද්‍රාව ..................

මුල් පිටපත දුටිමි
සහතික පිටපතක් බව සහතික කරමි
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 06

**බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස් කිරීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)**

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
   බස්නාහිර පළාත් සභාවේ ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස්කිරීම සඳහා වන වෘත්තිය පරීක්ෂණය (ප්‍රායෝගික)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි රථ සහ පොම්ප භාවිතය | අදාළ වන පරිදි | 100 | 60 |
| ගිනි රථ පැදවීම | අදාළ වන පරිදි | 100 | 60 |

3. පවත්වනු ලබන බලධරයා :
   පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
   පුරප්පාඩු ඇතිවන අවස්ථාවල දී

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ........
දිනය : ........

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි රථ සහ පොම්ප භාවිතය | 1. විවිධ ගිනි රථ ක්‍රියාකරවීම පිළිබඳ ප්‍රායෝගික හැකියාව<br>2. ගිනි නිවීම් සේවා පොම්ප ක්‍රියා කරවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම |
| ගිනි රථ පැදවීම | විවිධ ගිනි රථ පැදවීමේ ප්‍රායෝගික හැකියාව සහ මාර්ග නීති පිළිපැදීම |

අත්සන ........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ........................ චන්ද්‍රානි සමරකෝන්
තනතුර ........................ පළාත් පාලන කොමසාරිස්
දිනය ........................ බස්නාහිර පළාත
නිල මුද්‍රාව ........................

2016.08.10

මුල් පිටපත සමඟ සසඳා සත්‍ය පිටපතක් බව සහතික කරමි
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරි (විරිය හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

උපලේඛන අංක : 07

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම:
බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |
| ගිනිරථ භාවිතය හා රිය පැදවීම | පැය 01 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග
වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...... 6ප/4/2/4/2/3/43
දිනය : ...... 16/8/2022

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 1. යාන්ත්‍රික ගිනිභට රාජකාරි සඳහා අදාළ සෛද්ධාන්තික කරුණු<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම්වලදී යාන්ත්‍රික ගිනිභට රාජකාරි සඳහා යොදා ගැනීමේ අවස්ථා පිළිබඳ දැනුම<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වලදී යාන්ත්‍රික ගිනිභට රාජකාරි පිළිබඳ දැනුම<br>4. ගිනි නිවීම් සේවා උපකරණ පිළිබඳ දැනුම |
| ගිනි රථ භාවිතය හා රිය පැදවීම | 1. ගිනි රථ සහ පොම්ප පිළිබඳ දැනුම<br>2. මාර්ග නීති පිළිබඳ දැනුම |

මුල් පිටපත බලන ලදී
සත්‍ය පිටපතක් බව සහතික කරමි

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

අත්සන ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ..........................
තනතුර ..... චන්ද්‍රානි සමරකෝන් .....
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත.
දිනය ..........................
නිල මුද්‍රාව ..........................
2016.08.10

උපලේඛන අංක : 08

**<u>බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)</u>**

1. විභාගයේ / වෘත්තිය පරීක්ෂණයේ නම :
බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ප්‍රායෝගික)

2. විභාගය / වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනිරථ භාවිතය හා රිය පැදවීම | අදාළ වන පරිදි | 100 | 60 |

3. පවත්වනු ලබන බලධරයා:
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනුලබන්නේකොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ..........
දිනය : ..........

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි රථ භාවිතය හා රිය පැදවීම | 1. පොම්ප පරීක්ෂා කිරීම<br>2. පොම්ප ක්‍රියාත්මක කිරීම<br>3. ජලය කඩින් කඩ ගෙනයාමපිළිබඳ ප්‍රායෝගික දැනීම<br>4. රිය පැදවීමේ කාර්යක්ෂමතාව<br>5. මාර්ග සංඥා භාවිතයේ ප්‍රායෝගික අවස්ථා<br>(එක් විෂයක් සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 20 වන අතර සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 12 ක් බැගින් උපරිම ලකුණු 60 ක්ලබාගත යුතුය) |

අත්සන ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම .......... චන්ද්‍රානි සමරකෝන්
තනතුර .......... පළාත් පාලන කොමසාරිස්
දිනය .......... බස්නාහිර පළාත
නිල මුද්‍රාව ..........
2016.08.10

මුල් පිටපත සමග සසඳා සත්‍ය පිටපතක් බව සහතික කරමි
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

ඇමුණුම 01

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත

1. නිලධාරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................

1.2 හැඳුනුම්පත් අංකය : ..............................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..............................................
..............................................
..............................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..............................................

මුල් පිටපත [illegible] සහතික කරමි.
එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරි (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව

2. පත්වීම පිළිබඳ තොරතුරු

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..............................
දිනය : ..............................

2.1 පත්වීම් දිනය : ..............................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..............................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත තනතුර : යාන්ත්‍රික ගිනභට

3.2 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3. සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය .............................

3.4 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.5 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත

3.6 උසස්වීමට පූර්වාසන්න සිව් /පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.7 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

3.8 බර වාහන රියදුරු බලපත්‍ර අංකය :
නිකුත් කළ දිනය :
වලංගු කාල සීමාව :

3.9 යාන්ත්‍රික ගිනිභට තනතුරට අදාළ සති 02 ක පුහුණු පාඨමාලාව සමත් වී තිබේද? ඔව් / නැත

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලේඛන අංකය : ..............................

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් යාන්ත්‍රික ගිනිභට තනතුරට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : .............................. ..............................................................

නිලධරයාගේ අත්සන

5. <u>දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් ...................................................................................................................

මහතා යාන්ත්‍රික ගිනිභටතනතුරට උසස් කිරීම සඳහා අයදුම් කිරීමට අදාළ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වෙමි.ඒ අනුව මෙම නිලධරයා විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

.........................................................

නිල මුද්‍රාව

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිළධාරී (සිරස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත් සභාව